# ශාස්වතවාදය හා උච්ඡේදවාදය පිළිබඳ සූත්‍ර පිටකාගත ඉගැන්වීම් ඇසුරෙන් අධ්‍යයනයක්

**තබ්බෝවේ කාරුණික හිමි**[1]

## හැඳින්වීම

බුදුරජාණන් වහන්සේ පහළ වූ ක්‍රි. පූ. 6 වන සියවස වනාහී නානාවිධ ආගමික සෛද්ධාන්තිකයන් විසින් සමස්ත භාරතය ම වෙළාගත් යුගයක් ලෙස අත්‍යන්තයෙන් ම හඳුන්වාදිය හැකි ය. මෙම යුගයේ බොහෝ බ්‍රාහ්මණ, ශ්‍රමණ, ජටිල, ආජීවක, පරිබ්‍රාජක, නිගණ්ඨාදීන් සිය ආගම්, දර්ශන, ලබ්ධීන්, මතවාද, ප්‍රතිපදා, සමයවාද, දෘෂ්ටි දේශනා කරමින් මහා පිරිස් පිරිවරා එකිනෙකා සමඟ වාද - විවාද කරමින් හා විවිධ ව්‍රත ආදිය සමාදන් වෙමින් කිසියම් විමුක්තියක් සොයන්නට විය.

බුදුරජාණන් වහන්සේ භාරතයේ පහළ වන විට සංකීර්ණ වූ ආගමික දෘෂ්ටි ජාලයක් පැවති බවට තහවුරු වන අතර ඒවා සියල්ල ප්‍රමාණාත්මක වශයෙන් දෙසැටක් වන බව දීඝනිකායේ අන්තර්ගත බ්‍රහ්මජාල සූත්‍රයේ සඳහන් වේ. මෙම දෘෂ්ටි සියල්ලන්ගේ ම අරමුණ බවට පත්වූයේ ලෝකයේ හා සත්ත්වයාගේ ස්වභාවය කුමක් ද යන්න විමසීමයි. මෙසේ භාරතය පුරා ම ව්‍යාප්ත ව පැවති ආගමික හා දාර්ශනික සම්ප්‍රදායයන් සත්ත්වයාගේ හා ලෝකයේ යථා ස්වභාවය අවබෝධ කරගැනීම සඳහා විවිධ දෘෂ්ටිවාදයන් ඉදිරිපත් කර ඇති අතර එම දෘෂ්ටිවාදයන් පිළිබඳ බුදුරජාණන් වහන්සේ කවර නම් අදහසක් ඉදිරිපත් කර ඇත් ද යන්න විමසීම වටී. එහෙයින් මෙම පර්යේෂණයේ දී භාරතීය ආගමික දෘෂ්ටිවාදයන්ගේ ස්වභාවය හා ඒ පිළිබඳ බෞද්ධ ආකල්පය කුමක් ද යන්න විමසීමට බඳුන් කෙරේ.

## පර්යේෂණ ක්‍රමවේදය

බෞද්ධ මූලාශ්‍රය තුළ ශාස්වතවාදය හා උච්ඡේදවාදය කවරාකාරයෙන් ප්‍රතික්ෂේප කොට ඇත්ද යන්න ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය මගින් අධ්‍යයනය කරනු ලැබේ.

## සාකච්ඡාව

### භාරතීය දෘෂ්ටිවාදය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්

පඤ්චස්කන්ධ සංඛ්‍යාත ලෝකයා හෙවත් සත්ත්වයාට අතරක් නොමැති ව සසර පුරා විඳින දුක අවබෝධ කරවා දී ඔහු නිර්වාණ මාර්ගයට ප්‍රවිෂ්ට කිරීම බුද්ධ දේශනාවේ ඒකායන අරමුණයි. එකී මාර්ගය වළකාලන මූලික ම සාධකයක් වන්නේ පුද්ගලයා විසින් දැඩිව අල්ලාගෙන ඇති දෘෂ්ටි සමුදායන් ය. වරක් බුදුරජාණන් වහන්සේ මෙම කාරණය

1. මානව ශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව. karunikathero@gmail.com

ම පැහැදිලි කරමින් මාගන්ධිය බමුණාට පෙන්වා දුන්නේ තමන් වහන්සේ ''දෘෂ්ටීන් තරයේ ග්‍රහණය නොකර ගනිමින් ඒවා පරීක්ෂා කොට අභ්‍යන්තරයේ වූ ශාන්තිය දුටිමි'' යනුවෙනි. මෙහි අභ්‍යන්තර ශාන්තිය යනුවෙන් ඇත්තේ නිර්වාණයයි. මීට අමතර ව දෘෂ්ටි පිළිබඳ විශේෂයෙන් කරුණු ඇතුළත් සූත්‍රයක් වන බ්‍රහ්මජාල සූත්‍රයේ සඳහන් කරුණු මඟින් ද බුදුරජාණන් වහන්සේ එවකට පැවති විවිධ වාද දැන සිටි බවත් ඒවා විචාරය කළ බවත් තහවුරු වේ. තත් සූත්‍රයේ භික්ෂූන් අමතා බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ, ''මහණෙනි නොයෙක් දර්ශනවාද ප්‍රකාශක වචන (අධිවුත්ති පදානි) පවසන මහණ බමුණෝ සිටිති. (සන්ති එකෙ සමණ බ්‍රාහ්මණා...... අනෙක විහිතානි අධිවුත්ති පදානි අභිවන්දන්ති.) යනුවෙනි. මේ අනුව සෑම දෘෂ්ටිවාදයක් විෂයෙහි ම පෘථුල අවබෝධයක් පැවති බුදුරජාණන් වහන්සේ එම එක් එක් දෘෂ්ටීන් පිළිබඳ කවර නම් අදහසක් ඉදිරිපත් කර ඇති ද යන්න පරීක්ෂා කිරීම වටී.

**ශාස්වතවාදය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්**

ශාස්වතවාදීන් වශයෙන් හැඳින්වෙන්නේ ලෝකය අනාදිමත් ය, අතීතයේ සිට පැවත එතැයි දරන අදහස ඇත්තවුන් ය. මීට අමතර ව හැම කල්හි පවත්නා යන අදහස මෙන් ම ශාස්වතවාද දෘෂ්ටි ඇති වීම ද (සස්සතවාදො එතෙ සන්ති සස්සතවාදා) ශාස්වතවාදය යැයි කියනු ලැබේ. යමක් විනාශ නොවී සදාතනික ව ගමන් කරන්නේ ද ඒ හේතුවෙන් ද ශාස්වතවාද නම් වේ. (අමරං නිච්චං ධුවන්ති සස්සත මෙ වචනාති) මින් අර්ථවත් වන මූලික කරුණු නම් ''ජීව වස්තූන්ගේ මරණය අජීව වස්තූන්ගේ විනාශය වැනි සියුම් බාහිර වශයෙන් අපට දක්නට ලැබුණ ද අභ්‍යන්තර වශයෙන් සෑම දා වෙනස් නොවී පවත්නා සත්තාවක් තිබේ ය, යන්නයි. බ්‍රහ්මජාල සූත්‍රයේ පෙන්වා දෙන අන්දමට මෙම ශාස්තවාදීහු සිය දෘෂ්ටිවාදය පදනම් කර ගන්නා කරුණු හතරක් ද එම කරුණු පදනම් කර ගන්නා නිසා ශාස්වත නමින් වාද හතරක් ද ඉදිරිපත් කළහ. එම වාද සතර පහත පරිදි ය.

i. පළමු ශාස්වතවාදය පුබ්බේනිවාසානුස්සති ඥානය අවබෝධ කර ගත් ඇතැම් මහණ බමුණෝ එක් කල්පයක් තුළ තමා උපන් භවයන් දක්නට සමත් ව මාගේ ආත්මය විනාශයට පත් නොවී පවතින්නේ යැයි සිතා ලෝකය හා සත්ත්වයා නිත්‍ය වෙතියි ප්‍රකාශ කළහ.

ii. දෙවන ශාස්වතවාදය පුබ්බේනිවාසානුස්සති ඥානය ලබන ලද ඇතැම් මහණ බමුණෝ කල්ප දහයක පෙර විසූ කඳ පිළිවෙළ දැක ලෝකය හා සත්ත්වයා නිත්‍ය යැයි ප්‍රකාශ කළහ.

iii. පුබ්බේනිවාසානුස්සති ඥානය ලබා කල්ප හතලිහකට පෙර විසූ කඳ පිළිවෙළ දැක ලෝකය හා සත්ත්වයා නිත්‍ය යැයි ප්‍රකාශ කළහ.

iv. තර්කය හා වීමංසනය මුල් කර ගනිමින් ඇතැම් මහණ බමුණෝ ලෝකය හා සත්ත්වයා නිත්‍ය වශයෙන් පවත්නා බව ප්‍රකාශ කළහ.

ආත්මවාදය සඳහා ඉඩක් නොලැබෙන බුදුසමය තුළ අවධාරණය කර ඇත්තේ අනාත්මවාදයයි. මෙම පැහැදිලි යථාර්ථය ඉදිරිපත් කිරීම සඳහා බුදුරජාණන් වහන්සේ

විශ්ලේෂණාත්මක ක්‍රමවේදයක් යටතේ පඤ්චස්කන්ධ විභාගය යොදා ගෙන ඇති අතර ඉන් උන්වහන්සේ අපේක්ෂා කර ඇත්තේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන යථාර්ථයත් චතුරාර්ය සත්‍යයත් පුද්ගලයාට අවබෝධ කර දීම සඳහා ය. පඤ්චස්කන්ධය යනුවෙන් දක්වා ඇත්තේ රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන කොටස් පහ ය. මෙම පඤ්චසක් න්ධයන් පහ මුල් කරගනිමින් ආයතන හා ධාතු විභාගය ද නිර්මාණය වී ඇති අතර එය ගැඹුරින් අධ්‍යයනය කිරීමෙන් සදාකාලික ව පවත්නා ආත්මයක් සොයා ගත නොහැකි බව අවබෝධ වේ.

**උච්ඡේදවාදය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්**

උච්ඡේද යන්නෙන් අදහස් වන්නේ සිඳීම, නැවත නො ඉපදීම යන්නයි. එමෙන් ම සත්ත්වයාගේ භව ගමන මේ ආත්මභාවයෙන් අවසන් වේ යැයි හැඟීන ගැනීම හා මරණින් මතු සම්පූර්ණයෙන් ම ආත්මයේ විනාශය සිදු වන්නේ ය යන්න ද මෙයින් අදහස් වේ. උච්ඡේදවාදයේ මූලික ලක්ෂණයක් වන්නේ ශාස්වතවාදය පිළිගන්නා පුනරුප්පත්තිය ප්‍රතික්ෂේප කිරීමයි. මෙසේ බලවත් දෘෂ්ටිවාදය වශයෙන් භාරතය පුරා පැතිර සිටි මෙම වාදීන් උච්ඡේදය ආකාර හතක් යටතේ අවධාරණය කර ඇත. ඒ පිළිබඳ බ්‍රහ්මජාල සූත්‍රයේ කරුණු අන්තර්ගත ව තිබේ.

උච්ඡේදවාදය බුදුරජාණන් වහන්සේ පහළ වූ සමයේ භාරතයේ ආරම්භ වූවක් නො ව එය වෛදික යුගය දක්වා දිවෙන දෘෂ්ටිවාදයකි. ඒ බව වේද හා උපනිෂද් ග්‍රන්ථ ගැඹුරින් පරීක්ෂා කිරීමෙන් අනාවරණය වේ. බුදුරජාණන් වහන්සේ ධරමාන සමයෙහි උග්‍ර භෞතිකවාදී චින්තනයක් ඉදිරිපත් කළ ශාස්තෘවරයෙක් වශයෙන් අජිතකේෂකම්බලට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. දීඝ නිකායාගත සාමඤ්ඤඵල සූත්‍රයෙහි ඔහු ඉදිරිපත් කළ දෘෂ්ටිවාදයන් දක්වා තිබේ.

දෘෂ්ටීන්හි ඇලීමේ ස්වභාවය නම් ලෝකය හා සත්තවයා නිත්‍ය ය, සුභ ය ආදි වශයෙන් ගැනීමයි. එවිට එම දෘෂ්ටිගතිකයා ලෝකයේ හා සත්ත්වයාගේ අනිත්‍ය ස්වභාවය නිත්‍ය වශයෙන් ද, දුක්ඛදායක ස්වභාවය සුවදායක වශයෙන් ද, අසුභ වූ දෙය සුභ වශයෙන් ද ගනී. සියලු දුක් කෙළවර කර නිර්වාණය අවබෝධ කර ගැනීමට යුහුසුලු වන පුද්ගලයා, බුදුසමයට අනුව ඉහතින් දක්වන ලද සියලු දෘෂ්ටීන්ගෙන් විනිර්මුක්ත වීම අනිවාර්ය වූවකි. මෙම දෘෂ්ටි ගතිකත්වය කොතෙක් දුරට පුද්ගලයාගේ නිර්වාණගාමී මාර්ගය වළක්නේ ද යන්න පැහැදිලි කරන්නේ නම් බුදුරජාණන් වහන්සේ එවැනි දෘෂ්ටිගතිකයන් හට පැවිද්ද පවා ලබා දීම යෝග්‍ය වූවක් ලෙස නොදකී. පැවිදි හා උපසම්පදා කිරීමට නුසුදුසු පුද්ගලයන් එකොළොස් දෙනෙක් බුදුරජාණන් වහන්සේ විනය පිටකයේ අවධාරණය කර ඇති අතර ඉන් ''තිත්ථිය පක්කන්තිකා'' නම් දෘෂ්ටිවාදයට එල්බගත් පුද්ගලයා ද ඉන් එක් අයෙකි. මෙහි තිත්ථිය පක්කන්තිකා යනුවෙන් අදහස් කර ඇත්තේ බුදු සසුනේ භික්ෂුවක් ලෙස පැවිදිව පසුව තීර්ථක ප්‍රව්‍රජාව හා ඔවුන්ගේ දෘෂ්ටිය වැලඳගත් පුද්ගලයා ය. එවැනි පුද්ගලයෙකු උපසම්පදාවට යෝග්‍ය නොවන අතර ඔහුට නිර්වාණාවබෝධය ද කිසි දිනක ලැබිය නොහැක්කකි.

බුදුසමය අවධාරණය කරනු ලබන්නේ පුද්ගලයා විසින් නිර්වාණය අවබෝධ කර ගැනීමට නම් ඔහු සියලු දෘෂ්ටි ප්‍රහාණය කළ යුතු බව යි. එසේ නොමැති වුව හොත් හෙතෙම නිරන්තරයෙන් සත්‍ය වෙනුවට මායාවෙන් වැසුණු ලෝකයේ අසත්‍යය

දකිනු ඇත. දෘෂ්ටි ගතිකත්වයට පත් පුද්ගලයාට ඉන් මිදීම සඳහා ද බුදුසමය මාර්ගයක් පෙන්වා දී ඇත. ඒ සඳහා අස්සා සූත්‍රයේ කරුණු තුනක් අවධාරණය කර ඇත්තේ මේ අයුරිනි.

i. අස්සාද දෘෂ්ටිය දුරු කිරීමට අනිත්‍ය සංඥාව වැඩිය යුතු ය.

ii. අත්තාහු දිට්ඨිය දුරුකිරීම පිණිස අනාත්ම සංඥාව භාවිත කළ යුතු ය.

iii. මිත්‍යා දෘෂ්ටිය දුරු කිරීම පිණිස සම්මා දිට්ඨිය වැඩිය යුතු ය.

තත් සූත්‍රයෙහි සඳහන් අන්දමට ප්‍රථමයෙන් දුරු කළ යුතු දෘෂ්ටිය වන්නේ අත්තාහු දෘෂ්ටියයි. එසේ අත්තාහු දෘෂ්ටිය දුරුකිරීමෙන් සෙසු දෘෂ්ටීන් ද දුරු වේ. බුදුසමයට අනුව දෘෂ්ටි ගතිකයා ඉන් මිදීම එකවර කළ යුතු නැත. ඔහු ක්‍රමයෙන් මිත්‍යාවෙන් මිදී ලෞකික සම්මා දිට්ඨියටත් පසු ව ලෝකෝත්තර සම්මා දිට්ඨියටත් පත් විය යුතු ය. එවිට සියලු දුක් නැති කර නිර්වාණය අවබෝධ කරගැනීම අතිශයින් පහසු වේ.

**නිගමනය**

මානව සංහතියේ ආරම්භයේ සිට ම මිනිසා ලෝකය පිළිබඳ වත් සත්ත්වයා පිළිබඳ වත් ගවේෂණය කරන්නට යෙදුණහ. එහි දී මිනිසාගේ ලෝකයේත් යථාර්ථය කුමක් ද කවරෙක් ඒ සඳහා පිළිසරණ වන්නේ ද යන කාරණා සඳහා විවිධ අදහස්, මතවාද ඉදිරිපත් විය. බදුසමයට අනුව ඒවා සියල්ල ම ශාස්වත හෝ උච්ඡේද යන දෘෂ්ටීන්ගෙන් එකක් ගත් අතර මිනිසාට යථාර්ථය පසක් කර දීම සඳහා ඔවුනට හැකියාවක් ලැබී නැත. එහෙත් බුදුසමය එම දෘෂ්ටීන් සියල්ල ම ප්‍රතික්ෂේප කොට යථාර්ථවත් ව ලෝකය පිළිබඳ වත් සත්ත්වයා පිළිබඳ වත් දැකීම සඳහා නව මාවතක් කියා දුනි. මෙහි දී අතිශයින් වැදගත් වන්නේ එම නවතම වූ ඉගැන්වීම තවත් එක් නව දෘෂ්ටියක් නොවීම ය. දෘෂ්ටිගතිකත්වයට පත්වීමෙන් මිනිසා යථාර්ථය නොදකින ප්‍රඥාවෙන් අන්ධ පුද්ගලයෙක් බවට පත් වනවා සේ ම ස්ව මතය පමණක් නිවැරදි හා සත්‍ය මතය යැයි ඒකමතිකත්වයකට පැමිණේ. බුදුසමය සැම විට ම උත්සාහ ගෙන ඇත්තේ ස්වච්ඡන්දතාවයෙන් හා වීමංසන බුද්ධියෙන් ලෝකයාත් සත්ත්වයාත් දෙස බලා නිවැරදි දේ පමණක් තෝරාගැනීමට මිනිසාට අවස්ථාව සලසා දීමයි. එහෙයින් බ්‍රහ්මජාල සූත්‍රය දක්වා ඇති පරිද්දෙන් සියළු දෘෂ්ටීන් ප්‍රතික්ෂේප කොට නව දෘෂ්ටියක් ඉදිපත් නොකර මිනිසාට යථාර්ථය පමණක් අවබෝධ කරගැනීමට මාර්ගය සැලසීම බුදුසමයේ අද්වීතීය භාවය විදහා දක්වයි.

**මුඛ්‍ය පදඃ** උච්ඡේදවාදය, දෘෂ්ටි, මුල් බුදු සමය, ශාස්වතවාදය

**ආශ්‍රිත ග්‍රන්ථ**

*දීඝ නිකාය*, බ්‍රහ්මජාල සූත්‍රය (2005). බුද්ධ ජයන්ති මුද්‍රණය. නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*දීඝ නිකාය*, සාමඤ්ඤඵල සූත්‍රය (2005). බුද්ධ ජයන්ති මුද්‍රණය, නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

බෝධි හිමි. (1994). 'බුදුරජාණන් වහන්සේගේ දෘෂ්ටිවාද සමීක්ෂාව' අසංග තිලකරත්න (සංස්.) *අභිධර්ම අධ්‍යයනය*. කොළඹ 10ඃ කරුණාරත්න සහ පුත්‍රයෝ.